# කලා සංස්කෘතික ප්‍රතිපත්තිය

## උදාර සංස්කෘතික ජීවිතයක්
## සහකම්පනීය ජනතාවක්

**ජාතික ජන බලවේගය**

# කලා සංස්කෘතික ප්‍රතිපත්තිය

උදාර සංස්කෘතික ජීවිතයක්
සහකම්පනීය ජනතාවක්

© ජාතික ජන බලවේගය

පළමු මුද්‍රණය 2024 සැප්තැම්බර්

විමසීම
**ජාතික ජන බලවේගය**
464/20,
පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
දුරකථනය : 011 2785612
වෙබ් : www.akd.lk / www.npp.lk

# හැඳින්වීම

කලා සංස්කෘතික අවකාශය යනු සමාජයක අතිසංවේදී කලාපයකි. එය මානව ප්‍රජාව වෙත කල් පසු වී බල පවත්වන අඩවියක් ලෙස පෙනුණ ද වර්තමානයේ සිදු ව ඇති ලාංකික සමාජ පරිහානියේ විශාල පදාසයක් මතු වන්නේ මේ කලාපයේ දුබල බව නිසා ය. ශක්තිමත් සිවිල් සමාජයක් අහිමි වීමේ ඛේදවාචකය උපදින්නේ කලා සංස්කෘතික ක්ෂේත්‍රයේ පදනම සිතාමතා ම බිඳදැමීමේ හේතුවෙනි. මේ තියුණු බාදනය අඩ සියවසකටතත් වඩා පැරණි ය. පසුගිය ආණ්ඩු රැසක් මඟින් සංස්කෘතික ක්ෂේත්‍රය ප්‍රසිද්ධ ලෙස ම නොසැලකිල්ලට බඳුන් කෙරිණ. දරුවෙකුගේ මුල් ළමාවියේ සිට තියුණු අවධානයකින් ගොඩනැඟිය යුතු සාකල්‍ය අධ්‍යාපන සිතියම කලින් කලට සිදු වූ දේශපාලන බලහුවමාරුවේ ගොදුරක් ව ඇත. පෙර පාසල, පාසල, කාර්මික විද්‍යාලය, විශ්වවිද්‍යාලය ආදි අවධි පසුකර එන පුද්ගලයා පරිපූර්ණ පුරවැසියෙකු නොවීමට හේතු වී ඇත්තේ දියුණු සංස්කෘතික ජීවිතයක් උරුම කිරීමට අර්බුදයට ගිය සමාජය අපොහොසත් වීම නිසා ය. එනිසා ම සංස්කෘතිය නම් අඩවිය මානව දිවියේ මුදුන් මුලක් බවට වන විශ්වාසය ද පලුදු වී ඇත.

මේ ක්ෂේත්‍රය; අධ්‍යාපනය, කලාව, ජනමාධ්‍ය හෝ ආගමික විශ්වාස ආදී එකිනෙක හා බැඳුණු අඩවි රැසක මිශ්‍රණයේ ප්‍රතිපලයකි. අද වන විට මේ සමස්ත අඩවියේ දිගුකාලීන බිඳවැටුම තෘෂ්ණාධික තරගය, අවිවේකය, ආතතිය, දිවිනසා ගැනුම්, අතෘප්තිය, ප්‍රචණ්ඩත්වය, පරිසරය නොතැකීම හා කෙලෙසුණු මානව ගරුත්වය ආදි කම්පනීය සමාජ විපාක සමුදායක් ජනිත කර ඇත. එසේ ම ජනමාධ්‍ය හා බැඳුණු පරාමිතීන් සහ භාවිතය කෙරෙන් ව්‍යාප්ත වූ අවරසිකත්වයෙන්, සරලමතික ප්‍රවේශයෙන්

මිදී, සමාජය වහා සුවපත් කරලිය යුතු වෙනස්කම් කළ හැකි අලුත් පරිකල්පනයක් ශ්‍රී ලාංකේය සමාජය ඉල්ලා සිටියි. එය, ඉතා බරපතළ අවධානයක් ඉල්ලා සිටින ක්ෂේත්‍රයකි. මෙය කළ හැක්කේ ජාතික පුනරුදයක් ඉලක්ක කරගත් කලා සංස්කෘතික ක්ෂේත්‍රයේ කෙරෙන බලගතු පරිවර්තනයක් මඟිනි. එය සිදු කිරීම අපගේ කලා සංස්කෘතික ප්‍රතිපත්තියේ අභිලාෂය යි.

එබඳු නව සමාජයක, අප අපේක්ෂා කරන දියුණු පුරවැසියා පිළිබඳ අපගේ අර්ථකථනය මෙසේ ය.

- ප්‍රාදේශික සහ ජාතික සංස්කෘතික උරුමය විචාරාත්මක ව ආරක්ෂා කොට උකහා ගන්නා අතර ම, ලෝකයේ කොතැනක වුවත් පහළ වන විශිෂ්ට සංස්කෘතික ජයග්‍රහණ විචාරාත්මක ව ස්වසන්තක කරගැනීමේ බුද්ධිය සහ නිර්මාණශීලීත්වය සහිත වූ ද
- මනුෂ්‍යත්වය පුළුල් අරුතින් වටහා ගැනීමේ හැකියාව සහිත වූ ද
- සංස්කෘතිය යනු මනුෂ්‍ය සමාජය බාහිර වශයෙන් ද මනුෂ්‍ය විඥානය අභ්‍යන්තර වශයෙන් ද වගා කිරීමේ විභවතාවක් බව දන්නා වූ ද
- සංස්කෘතිය යථාවාදී ව හැඩගසා ගැනීම උදෙසා කුසලතාව ඇත්තා වූ ද
- සංස්කෘතිකවත් බව පිළිගැනීම මඟින් කල්පවත්නා වූ ද දැරිය හැකි වූ ද සංවර්ධනය ඔස්සේ සහජීවනය සහිත රටක් නිර්මාණය කිරීමට දායක විය හැකි විශ්වව්‍යාපී පුරවැසියෙකු බිහිකර ගැනීම අපගේ සංස්කෘතික ප්‍රතිපත්තියේ කේන්ද්‍රීය තේමාව වේ.

දැක්ම:

බහුවිධ සංස්කෘති පිළිගන්නා නිවහල්, විචාරශීලී, මානව ගරුත්වයෙන් යුතු නව සංස්කෘතික මිනිසෙකු නිර්මාණය කර ගැනීම

---

පදනම් මූලධර්ම:

01 සැම ප්‍රජාවකගේ ම සංස්කෘතික අනන්‍යතාව සංරක්ෂණයේ ද පරිණාමයේ ද අයිතිය පිළිගැනීම.

02. සංස්කෘතියේ වර්ධනය උදෙසා සැම ප්‍රජාවකට ම සහ ඒකපුද්ගල මිනිසාට ඇති අයිතිය පිළිගැනීම.

03. දේශීය සේ ම විදේශීය සංස්කෘතික ඥානය අත්පත් කරගෙන සබුද්ධික, භාවමය ධාරිතාවෙන්, ද වින්දන ශක්තියෙන් ද යුතු සහකම්පනීය මිනිසෙකු ගොඩනැගීම.

04. සංස්කෘතික විවිධත්වය අගය කරමින් සිදුවන අන්තර් පෝෂණය ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමේ තීරණාත්මක පදනමක් ලෙස පිළිගැනීම.

---

පරමාර්ථ:

01 අන්තර් සංස්කෘතික පෝෂණය සහ සංස්කෘතික පරිණාමය ආරක්ෂා කිරීම


02 සංස්කෘතික විවිධත්වය හා සංස්කෘතික විචාරය පිළිගැනීම

03 සංස්කෘතික නිෂ්පාදිතය සාධාරණ ලෙස බෙදී යෑම හා දේශපාලන අතපෙවීමෙන් නිදහස් අඩවියක් ලෙස පවත්වා ගැනීම

04 සංස්කෘතිකවත් පුරවැසියකු නිර්මාණය කිරීම රාජ්‍යයේ සවිඥානක මැදිහත්වීමක් ලෙස පිළිගැනීම

---

# සංස්කෘතියෙහි එක් ප්‍රධාන අංගයක් ලෙස කලාව:



'සංස්කෘතිය' යන්නෙන් කලාව පමණක් අදහස් නොවුණත් අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පරිකල්පනය කැරෙන නව සංස්කෘතික මිනිසා ගොඩනැඟීමේ දී කලාව තීරණාත්මක අඩවියක් වෙයි. සංස්කෘතිය යන අවකාශය මානව හැසිරීම් හෝ සිතීම් ලෙස පවතී. එකී විශිෂ්ට චර්යා හා පරිහරණයට ගැනෙන පහසුකම් හෝ වින්දන අඩවි ලෙස ද සංස්කෘතිය ගැබ් වී ඇත්තේ කලාව හා කලා නිර්මාණ ඇසුරෙහි ය. සියලු කලා ක්ෂේත්‍ර අළලා සකස් කෙරුණු සවිස්තරාතමක ක්‍රියාකාරී සැලැස්මේ සංක්ෂිප්තය පහත දැක්වේ.

**පොදුවේ කලා-සංස්කෘතික ක්ෂේත්‍රවල උන්නතිය පිණිස ගන්නා ක්‍රියාමාර්ග:**

- සංස්කෘතිය යන්න පුළුල් ජීවන පදාසයක් නිරූපණය කෙරෙන විචිත්‍ර අඩවියක් බව පෙන්වා දෙන අධ්‍යාපන ප්‍රතිපත්තියක් ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ම ඇති කිරීමට අවශ්‍ය විෂය නිර්දේශ ප්‍රසාරණය කිරීම සඳහා මඟ පෙන්වීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රය යනු සංස්කෘතික පුරවැසියා ගොඩනැඟීමේ පදනම ලෙස සලකා සියලු ම අධ්‍යාපන අවධීන් ඇසුරු කරගෙන සංස්කෘතිකවත්භාවය වර්ධනය කිරීමෙහිලා වැඩසටහන් මාලාවක් දියත් කිරීම.

- සාහිත්‍යය, සිනමාව හෝ නාට්‍යය ආදි කලා ප්‍රවර්ගයන්ට අදාළ ව 'ජාතික අරමුදලක්' ගොඩනැඟීම. එය රාජ්‍යය සහ පෞද්ගලික අංශයේ අඛණ්ඩ දායකත්වය සහිත ව පවත්වා ගෙන යෑම සහ සියලු කලා ක්ෂේත්‍ර උදෙසා සංවිධිත හා සක්‍රිය ලෙස ශක්තිය සැපයීම.
- ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය ජාලා භාවිත කර පොත පත කියවීම, කලා රසවින්දනය පිළිබඳ මහජන අවකාශයෙහි කතිකාව තීව්‍ර කරමින් විසි එක් වැනි සියවසෙහි සංස්කෘතිකවත් පුරවැසියා නිර්මාණය කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සංස්කෘතිය, යෞවනයා වෙත සමීප වන උපක්‍රම පරිකල්පනය කිරීම සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සැලැසුම් කොට ක්‍රියාත්මක කිරීම මඟින් නව සංස්කෘතික පුරවැසියා ගොඩනැඟීම.
- නිල අධ්‍යාපන පද්ධතිය තුළ සෞන්දර්ය කලා විෂයයන් ඉගැන්වීම ආකර්ෂණීය වූ ද, බුද්ධි ප්‍රබෝධනයට තුඩු දෙන්නා වූ ද ආකාරයට ඉගැන්වීම පිළිබඳ ක්‍රමවත් පුහුණුවක් ගුරුවරුන්ට ලබා දීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය සමඟ ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සෑම කලා ක්ෂේත්‍රයක ම නව දැනුම හා පුහුණුව ලබා ගැනීම සඳහා තෝරා ගත් සුදුස්සන් අන්තර්ජාතික ආයතන වෙත යොමු කිරීමට ශිෂ්‍යත්ව දිනා ගැනීම හා අලුතෙන් ඇති කිරීම.
- සෑම ප්‍රධාන නගරයක ම කලා-සංස්කෘතික කටයුතු සඳහා ආයතන කලාපයක් දිස්ත්‍රික්කයකට එක බැගින් ගොඩනඟා ඒ කලාපය වෙත පුරවැසියන් නිරන්තරයෙන් ආකර්ෂණය කර ගන්නා වැඩසටහන් දියත් කිරීම.
- ශක්තිමත් බුද්ධිමය දේපළ පනතක් ඇති කොට, කලාකරුවාගේ නිර්මාණ අයිතිය තහවුරු කිරීම සහ ලෝක බුද්ධිමය හිමිකම් සංවිධානයේ (The world intellectual property organization - WIPO) සාමාජිකත්වය සක්‍රීය කර ඒ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.

- විශ්ව සාහිත්‍යය, ජාතික භාෂාවන්ට පරිවර්තනය කිරීම කේන්ද්‍ර කරගත් ජාතික ආයතනයක් ඇති කිරීම හා අන්තර්ජාතික පරිවර්තන හිමිකම් ලබා ගැනීම විධිමත් කිරීම.
- දැනට ක්‍රියාත්මක රාජ්‍ය සම්මාන උලෙළවල දුර්වලතා සමාලෝචනය කර, සියලු කලා ක්ෂේත්‍ර අළලා දියුණු ජාතික සම්මාන උලෙළක් සංවිධාන කිරීම.
- විවිධ කලා ක්ෂේත්‍රයන්ට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ, කඩදාසි ඇතුළු සියලු කලා ක්ෂේත්‍ර වෙත පනවා ඇති බදු අවම කිරීම.
- සියලු කලා ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් සහ විශ්‍රාමිකයන්ගේ සුබසාධනය පිණිස වන සමාජ ආරක්ෂණ ක්‍රමයක් සැලැසුම් කොට ක්‍රියාත්මක කිරීම.
- කලා සංස්කෘතික ක්ෂේත්‍රයට සම්බන්ධ සම්මන්ත්‍රණ ශාලා, රඟහල, එළිමහන් රංග පීඨ ආදි භෞතික සම්පත් සංගණනයක් කොට දත්ත පදනමක් සැකසීම සහ ඒවා ක්ෂේත්‍ර වෙත ලබා දීමේ සංයුක්ත වැඩපිළිවෙළක් සැකසීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සංස්කෘතික මධ්‍යස්ථාන, බහුකාර්ය සංස්කෘතික කේන්ද්‍ර බවට පරිවර්තනය කොට වේදිකා, පුහුණුවීම්, ආලෝකකරණ, ශබ්ද ආදි පහසුකම් සහිත ව, පොත් දොරට වැඩුම්, වැඩමුළු, සංවාද, ප්‍රදර්ශන ආදි සංස්කෘතික අත්දැකීම් මේ මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගෙන පවත්වා ගෙන යෑම.
- යථෝක්ත බහුකාර්ය සංස්කෘතික කේන්ද්‍රවලට අනුබද්ධ ව, කලා සංස්කෘතික ක්ෂේත්‍රයේ නිර්මාණකරුවන්ට සිය නිර්මාණ කාර්ය ආශ්‍රිත ව නේවාසික පහසුකම් ලබා ගැනුමට අවකාශ සැලසීම.
- ගෝලීය සංස්කෘතික නිෂ්පාදනයන්හි පාරිභෝගිකයන්, රසිකයන් වීමෙන් නොනැවතී අපේ නිර්මාණවල රසිකයන් බවට ගෝලීය සමාජය පත් කර ගන්නා තත්ත්වයට අපේ කලා සංස්කෘතික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම ඔස්සේ අපේ

කලා නිර්මාණ, ලෝක රසවින්දන ආර්ථිකයෙහි කොටසක් අත්පත් කර ගන්නා තත්ත්වයට ඔසවා තැබීම

- රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ඔස්සේ කලා නිර්මාණ, සංස්කෘතික දැනුම සහ තාක්ෂණය අන්තර් හුවමාරුව සඳහා අන්තර්ජාතික තලයේ නව මාවත් විවෘත කර ගැනීම
- දැනට පවත්නා කලා මණ්ඩල සහ අනුමණ්ඩල පනත ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් කොට විසි එක් වන සියවසට අනුරූප වන කලා මණ්ඩල සහ අනුමණ්ඩල (Sri Lanka Council for the Arts) ව්‍යුහයක් ස්ථාපිත කිරීම.
- නව නිර්මාණ කලා (Creative Arts) නිෂ්පාදනය සහ ප්‍රවර්ධනය සඳහා අවැසි තරගකාරී මූල්‍ය ආධාර ක්‍රමයක් (Competitive Creative Arts Fund Scheme) කලා මණ්ඩලය යටතේ ස්ථාපනය කොට හඳුන්වා දීම සහ නව ප්‍රාසාංගික කලා නිර්මාණකරණය සඳහා ශක්‍යතා පදනම් කරගත් තේරීම් ක්‍රමයක් යටතේ මූල්‍ය අනුග්‍රහ ලබා දීම.

# ඒ ඒ කලා ක්ෂේත්‍රවල වර්ධනයට ගන්නා විශේෂිත පියවර

## සාහිත්‍ය ක්ෂේත්‍රය:



- ජාතික හා විශ්ව සාහිත්‍ය ප්‍රමාණවත් ලෙස පාසල් හා විශ්වවිද්‍යාලයීය විෂය නිර්දේශවලට ඇතුළත් කිරීමට මඟ පෙන්වීම.
- වාර්ෂික ව පළ වන සාහිත්‍ය කෘතිවලින් කලාත්මක වශයෙන් උසස් කෘති මිල දී ගෙන පාසල් පුස්තකාලය සහ මහජන පුස්තකාලය වෙත බෙදා හැරීම.
- සෑම නගරයක ම හෝ උපනගරයක ම පාහේ දියුණු පුස්තකාලය ඇති කොට සක්‍රීය පාඨක සමාජ පිහිටුවීම හා ගෘහස්ථ පුස්තකාලය සඳහා දිරි දීම.
- සාහිත්‍ය විචාරය සහ රස වින්දනය සඳහා ම වෙන් වූ සඟරා සංස්කෘතියක් යළි ඇති කිරීම පාසල් ගුරුවරුන් සහ ශිෂ්‍යයන් ඉලක්ක කරගත් සාහිත්‍ය රසවින්දන වැඩසහටහන් සංවිධානය මඟින් අලුත් රසික පිරිසක් ගොඩනැඟීම
- විශිෂ්ට විශ්ව සාහිත්‍ය කෘති සිංහල සහ දෙමළ භාෂාවලට නඟා පළ කිරීමේ වැඩසටහන් ඇති කිරීම සහ එවන් පරිවර්තනවල යෙදෙන අයට දිරි දීම.

- සිංහල - දෙමළ විශිෂ්ට කෘති ඉංග්‍රීසි භාෂාවට හා විශිෂ්ට සිංහල කෘති දෙමළ භාෂාවට ද ; විශිෂ්ට දෙමළ කෘති සිංහලට ද පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියක් සක්‍රීය ව පවත්වා ගෙන යාම.

- සිංහල හා දෙමළ උසස් සාහිත්‍ය කෘති ඉංග්‍රීසි ඇතුළු විදේශ භාෂාවන්ට පරිවර්තනය කර ගෝලීය ප්‍රකාශන ආයතන ඔස්සේ ලෝකය වෙත ගමන් කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම

- ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ පොත් ප්‍රදර්ශන හා ප්‍රකට විදේශීය පොත් ප්‍රදර්ශන සංවිධාන කිරීම සඳහා ලේඛකයන්ට හා ප්‍රකාශකයන්ට දිරි දීම.


- රාජ්‍ය ලේඛනාගාරය පූර්ණ ස්වයංක්‍රීකරණ පහසුකම් හා නවීන තාක්ෂණික පහසුකම් සහිත ව ප්‍රතිසංවිධාන කිරීම.

- විද්‍යුත් ප්‍රකාශනවලට, අධ්‍යාපන සහ පයේෂණ කේන්ද්‍රයනට අනුබද්ධ ඩිජිටල් ඥාන කෝෂ්ඨාගාර පවත්වාගෙන යෑමට දිරි දීම.

- මුද්‍රණය වන සියලු ම ප්‍රකාශනවලින් පිටපත් පහක් රාජ්‍ය ලේඛනාගාරය වෙත ලබා දීමට අතිරේක ව, ජාතික මට්ටමින් ඇගැයීමට ලක් වන නව ප්‍රකාශන, සියලු ම රාජ්‍ය විශ්වවිද්‍යාලය, ගුරු විද්‍යාලය, පළාත් පාලන බලප්‍රදේශවල පුස්තකාලය වෙත ලබා දීමට වැඩපිළිවෙළක් සැකැසීම.

- සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ පයේෂණ අරමුදලක් පිහිටුවා විධිමත් ලෙස පයේෂණ සඳහා අරමුදල් සම්පාදනය හා අන්තර්ජාතික පර්යේෂණ සැසි වාර්ෂික ව සංවිධාන කිරීම.

# සිනමා සහ ටෙලිනාට්‍ය ක්ෂේත්‍රය:



- පාසල් හා විශ්වවිද්‍යාලයීය විෂය නිර්දේශවල ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය අධ්‍යාපනයේ සම්ප්‍රදානය නැවත සලකා බැලීම හා එකී පුහුණුව වෘත්තීය ඉලක්ක සඳහා සම්බන්ධ වන අනුයාත වැඩපිළිවෙළක් සැකැසීම.
- ජාතික චිත්‍රපට සංස්ථාව කඩිනමින් ප්‍රතිසංවිධානයකට යොමු කර, අන්තර්ජාතික සබඳතා සහිත ජාතික චිත්‍රපට ආයතනයක් බිහිකිරීම.
- දැනට තිබෙන චිත්‍රපට ශාලා සංවිධිත වැඩපිළිවෙළක් සහිත ව නවීකරණය කිරීම හා සෑම දිස්ත්‍රික්කයකට ම සිනෙ සිටි හා මිනි සිනමා සංකල්පය අනුව ශාලා 3 බැගින් අලුතෙන් ඇති කිරීමට කටයුතු කිරීම.
- චිත්‍රපට හා ටෙලිනාට්‍ය නිෂ්පාදනයට ණය සහ වෙනත් සහන ආදිය ලබා දීම ප්‍රමිතිගත කිරීම.
- සෑම සිනමා කෘතියක් ම බෙදාහැරීමේ දී සාධාරණ අනුපිළිවෙළ අනුගමනය කිරීම හා සංවිධිත ලෙස ප්‍රමුඛතාකරණය කිරීම.
- වාරණ ප්‍රතිපත්ති ඉවත් කරමින් සිනමා කෘති වර්ගීකරණ මණ්ඩලයක් මඟින් ප්‍රමිතිගත කිරීම.
- වාර්ෂික අන්තර්ජාතික සිනමා උලෙළක් පැවැත්වීම හා අන්තර්ජාතික සිනමා උලෙළ සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට අනුග්‍රහය ලබා දීම.

- බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන උපයෝගි කර ගනිමින් විශිෂ්ට සිනමා කෘති ප්‍රදර්ශනය කිරීම හා ඒ ඇසුරින් සිනමා-කලා සංවාද සංවිධාන කිරීම.
- ආධුනික සිනමාකරුවන් වෙනුවෙන් ජාතික ටෙලි-සිනමා අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරීම සහ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා පිරිනැමීමේ වැඩසටහන් මෙන් ම ඒවා ජාතික වෘත්තීයමය සුදුසුකම් (NVQ) සමග සම්බන්ධ කිරීම
- ජාතික සිනමා සංරක්ෂණාගාරය කඩිනමින් පිහිටුවීම.
- දැනට පෞද්ගලික මට්ටමින් පවත්වා ගෙන යන සිනමා සංරක්ෂණාගාර සඳහා පහසුකම් සැලසීම, ප්‍රතිසංවිධානය මෙන් ම ජාතික සංරක්ෂණාගාර ජාලයකට යොමු කිරීම.
- ටෙලිනාට්‍ය ක්ෂේත්‍රය ප්‍රමිතිගත කිරීමට ව්‍යුහයක් ඇති කිරීම හා මිල දී ගැනීමේ ක්‍රියාවලිය පාරදෘශ්‍ය කිරීම.
- රූපවාහිනී-සිනමා සමාජ පාසල් මට්ටමින් ආරම්භ කිරීම.
- ටෙලි-සිනමා නිර්මාණවල බුද්ධිමය දේපළ සම්බන්ධ නෛතික තත්ත්වයන් නැවත සලකා බැලීම හා අන්තර්ජාතික තලයේ නීති පද්ධති හඳුන්වා දීම.
- ලාංකේය සිනමා කෘති කලාපීය සහ ගෝලීය ප්‍රේක්ෂකාග ාර වෙත ගමන් කිරීමට අවශ්‍ය රාජ්‍ය තාන්ත්‍රික පහසුකම් සැලසීම.
- ලාංකේය මාලා නාට්‍ය සහ චිත්‍රපට නෙට්ෆ්ලික්ස් සහ ඇමසන් ප්‍රයිම් වැනි ඕටීටී වේදිකාවන් තුළ ප්‍රදර්ශනයට අවශ්‍ය පහසුකම් සැලසීම
- ලාංකේය ශිල්පීන් අන්තර්ජාතික නිර්මාණවලට දායක වීමට අවශ්‍ය පහසුකම් රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ඔස්සේ වර්ධනය කිරීම.
- කෙටි චිත්‍රපට හා ජංගම දුරකථන සිනමා උලෙළ විධිමත් ලෙස වාර්ෂික ව පැවැත්වීම හා අන්තර්ජාතික උලෙළවල අත්දැකීම් හා දැනුම ලැබෙන වැඩසටහන් සැකසීම.



# නර්තන ක්ෂේත්‍රය:

- නර්තනය සම්බන්ධ විෂයමාලාහි අවකාශ යළි සලකා බැලීම හා ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා අන්තර් සබඳතා ඇති වන සේ ප්‍රවර්ධනය කිරීමට මඟ පෙන්වීම.
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවස්ථාවල දී නර්තන අධ්‍යාපනය සම්බන්ධ ආයතන, ගුරුකුල හා ප්‍රවීණයන් සම්බන්ධ කරගැනීම.
- නර්තනය සුරැකීම හා ප්‍රවර්ධනය මූලික කරගත් ජාතික ආයතනයක් බිහි කිරීම හා බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථානවල අනුයාත සම්බන්ධය ඒ සමඟ බද්ධ කිරීම.
- ලාංකේය ජන නර්තන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා අන්තර්ජාතික ආයතනවලට පර්යේෂණ යොමු කිරීම.
- වාර්ගික අනන්‍යතාවක් සහිත නර්තන සම්ප්‍රදායයන් ප්‍රවර්ධනය කිරීම.
- රජයේ ලියාපදිංචි නර්තන කලායතන ජාලය ගොඩනැඟීම සඳහා ව්‍යුහයක් ස්ථාපිත කිරීම.

- නර්තනය පිළිබඳ අන්තර්ජාතික අධ්‍යයන අවකාශ සලසා දීම හා ශිෂ්‍යත්ව පිරිනැමීම විධිමත් කිරීම.
- නර්තන කුසලතා පූර්ණ දරුවන් ග්‍රාමීය මට්ටමින් හඳුනා ගෙන අන්තර්ජාතික තලය තෙක් ප්‍රවර්ධනය කිරීම.
- නර්තන විෂය පිළිබඳ ත්‍රෛභාෂා ශාස්ත්‍රීය ග්‍රන්ථ මුද්‍රණයට දිරි දීම හා අන්තර්ජාතික ඥානය සිංහල, දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම.
- සමකාලීන හා සාම්ප්‍රදායික නර්තන කලා අධ්‍යයනය, පර්යේෂණය හා සංරක්ෂණය සඳහා පහසුකම් සැලසීම.
- දියුණු නිර්මාණ ජාත්‍යන්තර අවකාශ වෙත ගමන් කිරීමට සහ කුසලතා පූර්ණ නර්තන ශිල්පීන් අන්තර්ජාතික නිෂ්පාදනවලට සම්බන්ධ වීමට අවශ්‍ය පහසුකම් සැලසීම



# නාට්‍ය හා රංග කලා සහ අභිවහන කලා

## ක්ෂේත්‍රය:

- නාට්‍ය හා රංග කලා සමග බැඳුණු පාසල්, වෙනත් ආයතනවල හා විශ්වවිද්‍යාලයීය විෂය නිර්දේශ නවීනත්වයට සහ යාවත්කාලීන බවට සරිලන සේ නැවත සැකසීමට මග පෙන්වීම.
- නාට්‍ය හා රංග කලාව පිළිබඳ ජාතික හා අන්තර්ජාතික පර්යේෂණ හා පුහුණුව සහිත වෘත්තීය රංග කලා පාසලක් ස්ථාපිත කිරීම
- පැරණි නාට්‍ය නිෂ්පාදනය හා සම්බන්ධ පිටපත්, රංග භාණ්ඩ, සිහිවටන හා පටිගත කිරීම් හැකිතාක් රැස්කර විධිමත් ලෙස සංරක්ෂණය කෙරෙන ජාතික නාට්‍ය හා ප්‍රාසාංගික කලා සංරක්ෂණාගාරයක් පවත්වාගෙන යෑම සහ නව නාට්‍ය නිෂ්පාදන හා බැඳුණු සියලු දැනුම හා සිහිවටන යට කී සංරක්ෂණාගාරය වෙත යොමු කෙරෙන වැඩපිළිවෙළක් සැකසීම.
- නාට්‍ය හා රංග කලා සහ අභිවහන කලා නිෂ්පාදනය හා ප්‍රදර්ශනය සඳහා සංවිධිත ලෙස මූලාධාර ලබාදීම මේ ක්ෂේත්‍රය සම්බන්ධ බදු සහන ලබාදීම.
- ග්‍රාමීය මට්ටමේ සිට නාට්‍ය හා ප්‍රාසාංගික කලාව ප්‍රවර්ධනයට බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය හරහා ජාතික තලය

දක්වා විධිමත් වැඩපිළිවෙළක් සැකසීම හා එය ජාතික නාට්‍ය සම්මාන උලෙළක් තෙක් රාජ්‍ය අනුග්‍රහයෙන් පවත්වාගෙන ඒම.

- සෑම ප්‍රධාන නගරයකම පූර්ණ පහසුකම් සහිත නවීන රංග ශාලා පද්ධතියක් බිහි කිරීම හා පවතින ශාලා ප්‍රවර්ධනය කොට එම ජාලයට ඇතුළත් කිරීම. මෙහි පළමු අදියර ලෙස දිස්ත්‍රික් පදනමින් රංගශාලා දාමයක් කඩිනමින් ඇති කිරීම.
- විශ්වීය නාට්‍ය පිටපත්, විචාර සහ ශාස්ත්‍රීය කෘති සිංහල හා දෙමළ භාෂාවලට පරිවර්තනය සහ ලෝක මට්ටමේ නාට්‍ය හා ප්‍රාසාංගික කලා නිෂ්පාදන මෙරට ප්‍රදර්ශනය කිරීමේ වැඩපිළිවෙළක් දියත් කිරීම
- නාට්‍ය හා ප්‍රාසාංගික කලා ක්ෂේත්‍රය සම්බන්ධ අන්තර්ජාතික ශිෂ්‍යත්ව ප්‍රවර්ධනය හා ප්‍රාදේශික හා ජාතික මට්ටමෙන් ඒවා පිරිනැමීම විධිමත් කිරීම
- නාට්‍ය හා ප්‍රාසාංගික කලා රසිකත්වය දියුණු කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම
- එළිමහන් රංගපීඨ සංකල්පය ප්‍රවර්ධනයට කොට්ඨාස හා සභා මට්ටමෙන් දිරි දීම හා විකල්ප රංග කලා අවකාශ සඳහා පහසුකම් සැලසීම
- වේදිකා නාට්‍ය හා අනෙකුත් ප්‍රාසාංගික කලා පුහුණුවීම් සඳහා යටිතල පහසුකම් සැලසීම
- රට තුළ නිර්මාණය කෙරෙන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වේදිකා නාට්‍ය විදේශ රටවල වේදිකා වෙත ගමන් කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම
- ලාංකේය වේදිකා නාට්‍ය ශිල්පීන් අන්තර්ජාතික නිර්මාණවලට දායක වීමට අවශ්‍ය ප්‍රවේශය ලබාදීම



# දෘශ්‍ය කලා
## ක්ෂේත්‍රය:

- චිත්‍ර, මූර්ති, ඡායාරූප සහ ඩිජිටල් කලා මාධ්‍ය ඇතුළත් දෘශ්‍ය කලා අවකාශ දැනට පවතින විෂයමාලාවල ඇතුළත් ව ඇති ආකාර යළි සලකා බලා ප්‍රතිසංවිධාන කිරීමට මඟ පෙන්වීම.
- චිත්‍ර, මූර්ති හා ඡායාරූප ඇතුළත් දෘශ්‍ය කලාවේ අතීත හා වර්තමාන නිර්මාණ සංරක්ෂණය, අධ්‍යයනය හා අන්තර්ජාතික තලයේ පර්යේෂණ මෙහෙයවීම සඳහා ජාතික ආයතනයක් ස්ථාපිත කිරීම.
- බහුකාර්ය සංස්කෘතික කේන්ද්‍රවලට අනුබද්ධ ව කලාගාර ස්ථාපිත කිරීම හා නිර්මාණ ප්‍රදර්ශනය සඳහා පහසුකම් හා තාක්ෂණය ලබා දීම.
- ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන සඳහා නිර්මාණකරුවන් යොමු කොට ආධාර සැපැයීම.
- පළාත් කේන්ද්‍රීය පුහුණු ආයතන ස්ථාපිත කිරීම හා ඒ අවකාශය වෘත්තීය අවස්ථා වෙත යොමු කිරීම.
- දෘශ්‍ය කලා නිර්මාණ අලෙවිය සඳහා ජාතික හා අන්තර්ජාතික නිර්මාණ වෙළෙඳපොළ ප්‍රවර්ධනය කොට සංචාරක කර්මාන්තය සමඟ සම්බන්ධ කිරීම.

- මේ නිර්මාණ ප්‍රවර්ග සමග බැඳුණු 'නිර්මාණ සමාජ' පාසල් මට්ටමේ සිට පවත්වාගෙන යෑම හා තරග සංවිධානය.
- මේ ක්ෂේත්‍රය හා සම්බන්ධ මෙවලම් සඳහා බදු සහන සැලසීම.



# සංගීත සහ ගීත නිර්මාණ ක්ෂේත්‍රය:

- සංගීතය හා ගීතය සබැඳි සියලු සම්ප්‍රදායයන් විෂය මාලාවන්ට ඇතුළත් වීම පිළිබඳ නැවත සලකා බැලීම හා ප්‍රවර්ධනය කිරීම.
- අධ්‍යාපන පතිසංස්කරණ අවස්ථාවල දී සංගීත අධ්‍යාපනය සම්බන්ධ ආයතන හා ප්‍රවීණයන් සම්බන්ධ කරගැනීම.
- සංගීත සම්ප්‍රදායයන් සුරැකීම හා ප්‍රවර්ධනය සඳහා ජාතික ආයතනයක් ස්ථාපිත කිරීම.
- ලාංකේය ජනසංගීත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ සංරක්ෂණය කිරීම, පැරැණි සංරක්ෂිත ඥානය නිසි ලෙස පර්යේෂණයට අධ්‍යයනයට අවස්ථාව සැලසීම.
- රජයේ ලියාපදිංචි සංගීත කලායතන ජාලය ගොඩනැඟීම සඳහා විශේෂ ව්‍යුහයක් ස්ථාපිත කිරීම.
- ගීත හා සංගීතය පිළිබඳ බුද්ධිමය දේපළ නීතිරීති නැවත සලකා බැලීම හා සංවර්ධනය කිරීම.

- අන්තර්ජාතික සංගීත අධ්‍යයනය හා පර්යේෂණය සඳහා අවකාශ සලසා දීම, ශිෂ්‍යත්ව ප්‍රදානය විධිමත් කිරීම.
- දෛනික ව පටිගත කෙරෙන සෑම ගීත සහ සංගීත නිර්මාණයක ම මුල් පිටපත් සංරක්ෂණය කෙරෙන ඩිජිටල් තාක්ෂණික ඒකකයක් රාජ්‍ය කේන්ද්‍රීය ව පවත්වාගෙන යෑම.
- සංගීත ක්ෂේත්‍රයේ තාක්ෂණික මෙවලම් සඳහා බදු සහන සැලසීම.
- කර්තෘවරුන් හා සංරචකයන්ගේ සංගම් සාමූහිකයේ (The International Confederation of Socities of Authors and Composers - CISAC) සාමාජිකත්වය ලබාගෙන සංගීත ක්ෂේත්‍රයේ බුද්ධිමය හිමිකම් ආරක්ෂා කිරීම.
- අපේ දියුණු සංගීත නිර්මාණ සහ ශිල්පීන් ගෝලීය රසික සමාජයට නිරාවරණය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

# අස්පර්ශනීය සංස්කෘතික උරුමය හා සාම්ප්‍රදායික කලා



- මේ අඩවිය ගා බැඳුණු දැනුම් කලාප විෂය මාලාවලට අන්තර්ග්‍රහණය කළ හැකි සේ ප්‍රතිසංස්කරණ කිරීම, දැනට සිටින විශිෂ්ටයන්ගේ ඥානය මේ සඳහා ලබා ගැනීම.
- අස්පර්ශනීය උරුමය හා සාම්ප්‍රදායික කලා සම්බන්ධ ජාතික පර්යේෂණායතනයක් බිහි කිරීම, දැනට පවතින උරුමය හඳුනා ගැනීම හා සංරක්ෂණය.
- ප්‍රාදේශීය මට්ටමින් මෙකී අඩවියේ ඥානය, මෙවලම්, ගුරුකුල හා සම්ප්‍රදායන් මෙන්ම මානව සම්පත හඳුනා ගැනීම හා ජාතික-අන්තර්ජාතික තලය තෙක් අඛණ්ඩ ලෙස ප්‍රවර්ධනය කිරීම.
- මේ අවකාශය සමග සංචාරක කර්මාන්තය බද්ධ කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම හා වෘත්තීන් හඳුනා ගෙන ආයෝජනය කිරීම.
- අස්පර්ශනීය උරුමය හා බැඳුණු වෙදකම, පරිසර හිතකාමී භාණ්ඩ නිෂ්පාදනය, විනෝදාස්වාද කර්මාන්තය, මානසික සුවතාව ප්‍රවර්ධනය ආදි උපක්ෂේත්‍ර දියුණුවට දිරි දීම.

- මෙකී විෂය කලාපය හා සම්බන්ධ විදේශීය සරසවි, පර්යේෂණ ආයතන සමඟ සබඳතා දියුණු කිරීම හා පශ්චාත් උපාධි මට්ටමින් අධ්‍යයනයට මඟ සැලසීම.
- සාම්ප්‍රදායික කලාකරුවන්, ගුරුකුල, ශිල්ප ආයතන හඳුනාගෙන ජාලගත කිරීම, ආධාර කිරීම, සුරක්ෂණය හා යාවත්කාලීන කිරීම.
- සාම්ප්‍රදායික කලා නිර්මාණ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමට දිරි දීම.